**ශීර්ෂය 227- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක

අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකිය.

(ආ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**1.6.1 <u>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ මුද්දර ආදායම් වාර්තාව අනුව මුද්දර ආදායම රු.2,704,455කි. නමුත් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියෙන් ලබාගත් වාර්තාව අනුව එය රු.2,924,736 කි. ඒ අනුව රු.220,281ක වෙනසක් නිරීක්ෂණය විය. | පරිගණක පද්ධතියේ අඩුපාඩු පවතී නම් ඒවා නිවැරදි කර යාවත්කාලීනව පවත්වාගෙන යාම. | නිවැරදි පරිදි වාර්තා කර ගැනීමට වැඩ පිළිවෙලක් යෙදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 04 කට හා මූලධන වැය විෂයයන් 07 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස්කම් සඳහා දක්වා ඇති හේතු පිළිගත හැකි මට්ටමක නොවීය. | අවශ්‍යතා හඳුනාගෙන තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම. | වෙනසට හේතු වන කරුණු අතපසුවීමකින් සටහන් කර නොමැත. |
| (ඇ) | 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සාමාන්‍ය සේවය යටතේ මුද්දර අලවන ලද අයදුම්පත් දෙපාර්තමේන්තුව සතුව පැවති අතර ඒවායේ මුද්දර ආදායම ආදායම් ප්‍රකාශයට ඇතුලත් වී නොතිබුණි. | 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සාමාන්‍ය සේවය යටතේ මුද්දර අලවන ලද අයදුම්පත් ආදායම වූ රු. 616,185 ක වටිනාකම ගිණුම් ගත කළ යුතු වීම. | වටිනාකම ලබාගෙන ඉදිරි වර්ෂයේදී ගිණුම් ගත කරන බව. |

**1.6.2** <u>මූල්‍ය තත්ව ප්‍රකාශය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශ අනුව හා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිතයට අනුව වත්කම් 7 ක වටිනාකම් අතර රු.46,252,598 ක ශුද්ධ වෙනස්කම් පැවතුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළයුතුවීම. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ඉදිරිපත්කළ මූල්‍ය ප්‍රකාශයේ වූ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛනය අනුව වර්ෂය තුළ අත්පත් කර ගෙන තිබූ වත්කම් වටිනාකම් අතර රු. 2,144,860 ක ශුද්ධ වෙනසක් පැවතුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කිරීම. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| | 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත - 2 වගන්තිය | ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීම (පුද්ගල දත්ත නාමාවලියක්) කර නොතිබුණි. | පනත අනුව ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීම. | කඩිනමින් වැඩපිළිවෙල ආරම්භ කිරීමට පියවර ගන්නා බව. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** 94(2) | වැය විෂයයන් 8ක් සඳහා නියමිත පරිදි සියයට 50ක ප්‍රතිශතය ඉක්මවා රු.4,864,191 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතුවීම. | දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතා අනුව අනුව කටයුතු කිරීමට සිදුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 7 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 46.36 ක ශුද්ධ ප්‍රතිපාදන යෙන් රු.මිලියන 5.48 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 90 ක් දක්වා වූ පරාසයක් තුල විය. එසේම මූලධන වැය විෂයයන් 7 ක ඉතිරිය එම වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 8 සිට 100 දක්වා වූ පරාසයක් තුල විය. | තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීම. අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ජාතික අයවැයට ඇති බලපෑම කෙරෙහි දැඩි අවධානය යොමුකල යුතු වීම. | අපේක්ෂා කල පරිදි වියදම් දැරීමට සිදු නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. |
| (ආ) | මූලධන වැය විෂයයන් දෙකක් සඳහා සලසා තිබුණු රු. මිලියන 2.5ක සම්පූර්ණ ප්‍රතිපාදනයම වියදම් නොවී ඉතිරිව පැවතුණි. | තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීම. අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ජාතික අයවැයට ඇති බලපෑම කෙරෙහි දැඩි අවධානය යොමුකල යුතු වීම. | වර්ෂයතුලදී වියදම් දැරීමට සිදු නොවීම. |
| (ඇ) | ප්‍රතිපාදන සලසා නොතිබුණු එක් වැය විෂයයක් සඳහා රු.මිලියන 5.93 ක මුදලක් මු.රෙ. 66/69 විධිවිධාන මඟින් වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. | තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීම. අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ජාතික අයවැයට ඇති බලපෑම කෙරෙහි දැඩි අවධානය යොමුකල යුතු වීම. | පසුව ඇති වූ අවශ්‍යතාවය මත භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී ගෙවා තිබුණු රු. මිලියන 3.91 ක බැරකම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන IV මඟින් අනාවරණය කර නොතිබුණි. | නිවැරදිව බැරකම් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම. | ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් ලබාදෙන ලදී. |
| (ආ) වැය විෂයය 15ක ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 13.43 ක අධි වැයක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන සීමාවන් තුල වැය දැරීමට කටයුතු කල යුතුවීම. | බිල්පත් ඉදිරිපත් නොවීම. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයට වෙන් කල රු. මිලියන 1,300 ක මුදලින් රු. මිලියන 883.44 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. | සැලසුම් කල කාර්යයන් ඵලදායී ලෙස ඉටුකිරීමට කටයුතු කළ යුතුවීම. | ව්‍යාපෘති සැලැස්ම සංශෝධනය කිරීමට සිදුවීම, 2018 වර්ෂයේ සංශෝධිත සැලැස්ම අනුමත නොවීම, පරිපාලනමය වෙනස්කම් සිදුවීම හා පාලනය කල නොහැකි කරුණු යෙදීම නිසා මෙවැනි තත්වයක් උද්ගත විය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ද්විත්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම, එකම අංකයට වෙනත් පුද්ගලයින්ගේ ඡායාරූප පැවතීම, | පැන නැගී ඇති ගැටළු කඩිනමින් විසඳා වයස සම්පූර්ණ වූ සෑම | ඉදිරියේදී කඩිනම් ක්‍රියාපිළිවෙලක් අනුගමනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා |

| | | |
|---|---|---|
| සංශෝධිත අයදුම්පත් සමඟ විකෘති කරන ලද හැඳුනුම්පත් හා වෙනත් පුද්ගලයන්ට හිමි හැඳුනුම්පත් ඉදිරිපත් කිරිම, ව්‍යාජ උප්පැන්න සහතික ඉදිරිපත් කිරීම වැනි හේතු මත දෙපාර්තමේන්තුවේ නීති අංශයට ගැටලු සහිත අයදුම්පත් 8609 ක් ලැබී තිබුණු අතර ඉන් අයදුම්පත් 3,096 ක් හෙවත් සියයට 36 ක වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | පුද්ගලයෙකුටම හැඳුනුම්පතක් නිකුත් කිරීම කළ යුතු වීම. | බව. |

**3.2** <u>දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------------------ | -------------------------------- |
| (අ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් 15 යටතේ වන අනු කාර්යයන් 46කින් කාර්යයන් 24ක භෞතික ප්‍රගතියක් නොමැති අතර, සියයට 10ත් සියයට 15ත් අතර භෞතික ප්‍රගතියක් පමණක් ලබා කර ගත් කාර්යයන් 03ක් පැවතුණි. අනෙකුත් කාර්යයන් සියයට 50ට වැඩි ප්‍රමාණයක් ඉටුකර තිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කර ව්‍යාපෘති අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. | සංශෝධිත ව්‍යාපෘති සැලැස්ම අනුමත කර ගැනීමට නොහැකිවීම හා ඉදිරියේදී නිසිපරිදි සංශෝධන අනුමත කර ගැනීමට පියවර ගැනීම. |
| (ආ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර 2018 වර්ෂයේ සැප්තැම්බර් මස නිම කිරීමට අපේක්ෂා කලද උතුරුමැද, ඌව සහ සබරගමුව පළාත් කාර්යාල ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් සොයාගත නොහැකි වීම මත එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකිරීමට කඩිනම්ව කටයුතු කිරීම. | සංශෝධිත ව්‍යාපෘති සැලැස්ම අනුමත කර ගැනීමට නොහැකිවීම හා ඉදිරියේදී නිසිපරිදි සංශෝධන අනුමත කර ගැනීමට පියවර ගැනීම. |
| (ඇ) | 2018 වර්ෂයේ සැප්තැම්බර් මස නිම කිරීමට අපේක්ෂා කල පුරවැසියන්ගේ ජීවමිතික දත්ත රැස්කිරීම සඳහා අදාල උපකරණ සැපයීම හා සවිකිරීම, | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුවීම. | ව්‍යාපෘති සැලැස්ම අනුමත නොවී ඇති බව පවසයි . |

| | | | |
|---|---|---|---|
| | සන්නිවේදන උපකරණ ස්ථාපිත කිරීම සහ පුද්ගල දත්ත රැස්කිරීම සම්බන්ධයෙන් අදහස් ලබාගැනීම, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් ලබාගැනීම යනාදිය සඳහා රු.මිලියන 545 ක ප්‍රතිපාදන වෙන්කර තිබූඅතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | | |
| (ඇ) | ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු හඳුනාගැනීමේ මෘදුකාංග ප්‍රසම්පාදනය හා දත්ත මධ්‍යස්ථානය සඳහා දෘඪාංග මිලදීගැනීමට, පුරවැසි දත්ත රැස් කිරීමේ කාර්යයට අදාලව නිලධාරීන් පුහුණු කිරීම දත්ත විද්‍යුත්කරණය කිරීම සහ ජාතික පුද්ගල නාම ලේඛනය ස්ථාපිත කිරීම, පුද්ගලාරෝපන පද්ධතිය වැඩි දියුණු කිරීම, විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරිම විද්‍යුත් හැඳුනුම්පත් කාඩ්පත් ප්‍රසම්පාදනය සහ විද්‍යුත් හැඳුනුම්පත නිකුත්කිරීම විමධ්‍යගතකරණය හා දත්ත තහවුරු කිරීමේ ක්‍රියාවලිය හා පරිශීලක අවශ්‍යතා හඳුනාගැනීම් අදාල ක්‍රියාවලිය සඳහා රු. මිලියන 5,082.50 ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් වර්ෂය අවසාන වනවිටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුවීම. | ව්‍යාපෘති සැලැස්ම අනුමත නොවී ඇති බව පවසයි . |

**3.3** <u>වත්කම් කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | -------------------- | ------------------------------ |
| (අ) | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශ අනුව හා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිතයට අනුව වත්කම් වටිනාකම් අතර රු.මිලියන 46.25 ක ශුද්ධ වෙනසක් පැවතුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි වත්කම් කාණ්ඩ යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

**3.4** <u>පාඩු හා හානි</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------------- | -------------------------- | ------------------------------ |
| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හැඳුනුම්පත් මුද්‍රණය කිරීමේදී විවිධ දෝෂයන් හේතුවෙන් සාමාන්‍ය සේවය යටතේ සියයට 5 සිට සියයට 14 ක ප්‍රමාණයක්ද එක්දින සේවය යටතේ සියයට 5 සිට සියයට 7 ක ප්‍රමාණයක්ද කාඩ්පත් අපතේ ගොස් තිබුණි. මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 6.05 ක පිරිවැයක් දරා තිබුණි. | දෝෂයන් අවම වන ආකාරයෙන් කටයුතු කිරීම. | ද්වි භාෂාවෙන් කටයුතු කිරීමට හැකියාව ඇති නිලධාරීන්ගේ පවතින හිඟය හේතු වී ඇත. |

**3.5** **<u>අනාර්ථික ගනුදෙනු</u>**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 වෙත 2015 වර්ෂයේදී පුද්ගල දත්ත නාමාවලින් සකස් කිරීම සඳහා ලබා දුන් අයදුම්පත්‍ර, අත්පත්‍රිකා, උපදෙස් පත්‍රිකා, ඇඟිලි සලකුණු පරිලෝකන පත්‍රිකා ආදිය භාවිතා නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රවල අනාරක්ෂිත ස්ථානවල ගබඩා කර තිබූ අතර මේවායේ වටිනාකම රු. මිලියන 396.35 ක් පමණ විය. | වසර 4 ක කාලයක් භාවිතයකින් තොරව විනාශවෙමින් පවතින නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම. | එම ද්‍රව්‍ය රජයේ වෙනත් කාර්යාලීය අවශ්‍යතාවන් සඳහා යොදාගත හැකිවේද යන්න සොයා බලමින් පවතින බව. |

**3.6** **<u>කළමනාකරණ දුර්වලතා</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) මහරගම, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ තිඹිරිගස්යාය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් කර තිබූ අයදුම්පත් සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු කැඳවීම් සිදු කර තිබුණු අතර පිළිතුරු එවීම සඳහා මාස 01 සිට මාස 11 දක්වා කාලයක් ගත කර තිබුණි. | විමර්ෂණ සිදු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් තොරතුරු සැපයීම. | ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන්අවම වන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. |

| | | |
|---|---|---|
| (ආ) එකම හැඳුනුම්පත් අංකය පුද්ගලයන් දෙදෙනෙකුට නිකුත් කර තිබූ අවස්ථාවන් වූ අතර හැඳුනුම්පත් දෙකෙහි පුද්ගල නාම සමාන වුවද ලිපිනයන් දෙකක් සහ පුද්ගලයන් දෙදෙනෙකුගේ ඡායාරූප පැවතුනි. මේ අනුව දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයෙකු වෙත මුල්වරට නිකුත් කර තිබූ හැඳුනුම්පතෙහි අංකය සහ එහි තොරතුරු දෙවන වරටත් වෙනත් පුද්ගලයෙකු වෙත නිකුත් වී තිබුණි. | දෝෂයන් අවම වන පරිදි කටයුතු කිරීම. | අදාල අයදුම්පත් විමර්ෂණය සඳහා යොමුකර ඇති බව හා අදාල විමර්ෂණ කටයුතු නිමවීමෙන් අනතුරුව එම වරද නිවරදි කිරීමට පියවර ගන්නා බව. |
| (ඇ) දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණු අඩුපාඩු සහිත අයදුම්පත්‍ර ගණන 15 ක් වූ අතර අවු 02 මාස 08 වැනි දීර්ඝ කාලයක් ගත වී ඇතත් ඒවා නිවැරදි කිරීමට හෝ අදාල පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම හෝමාගම සහ තිඹිරිගස්යාය ප්‍රදේශිය ලේකම් කාර්යාලවලද විවිධ හේතු නිසා එසේ ප්‍රමාද වී පැවති අයදුම්පත් සංඛ්‍යාව 284 ක් පමණ විය. | ඉදිරිපත් වන අයදුම්පත් පිළිබඳව කඩිනමින් කටයුතු කර හැඳුනුම්පත් නිකුත් කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇතිනොවන ආකාරයට අඩුපාඩු සකස්කර ගන්නා ලෙස අදාල නිළධාරීන් දැනුවත් කල බව. |

## 4. <u>යහපාලනය</u>

### 4.1 <u>මහජනයා වෙත සේවා ඉටු කිරිම</u>

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පාසැල් 03 කින් ලැබී තිබූ අයදුම්පත්‍ර 783 ක්ම මාස 4කට ආසන්න කාලයක්, ගතවී ඇතත් ඒවාට නියමිත ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණි. එම අයදුම්පත්‍ර වල | අඩුපාඩු පරික්ෂා කර කඩිනමින් හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. | පාසල් සංඛ්‍යාව වැඩි නිසා සහ එක් දින අයදුම්පත් ප්‍රමාණය වැඩි නිසා කාර්ය නිම කිරීමට නොහැකිවීම. |

සම්පූර්ණත්වය ද පරීක්ෂා
කර නොතිබුණි.